# කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

## නීති පීඨය

## නීතිවේදී උපාධි පරීක්ෂණය, පළමු වසර -2018

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය - I

(කාලය පැය තුනයි)

සම්පූර්ණ ප්‍රශ්න සංඛ්‍යාව: 07

ප්‍රශ්න <u>හතරකට **(04)** පමණක්</u> පිළිතුරු සපයන්න

(අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.)

1. 'නීතියේ බලය' සහ 'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවාදය' යන සංකල්පයන්හි බොහෝ පොදු ලක්ෂණයන් තිබුණද ඒවායෙහි ප්‍රායෝගික භාවිතය තුළ ඒවාට ආවේණික වූ වෙනස් සම්බන්ධයන් පවතී.

   ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟවන්නේනම්ද? අදාළ උදාහරණ ඇසුරින් ඉහත මූලධර්මයන් ද්විත්වයෙහි විෂය පථය සාකච්ඡා කරන්න.

2. ලංකාවේ සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ ශ්‍රී ලංකාවේ දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බලතල බෙදීමේ න්‍යාය පිළිගන්නා අතර ශ්‍රී ලංකාවේ පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව එයට ප්‍රතිවිරුද්ධ වන බවට තර්ක කෙරේ.

   ඉහත ප්‍රකාශය ඇසුරින්, ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීති ව්‍යවහාරය කෙරෙහි අවධානය යොමු කරමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය පාලනයක් සම්බන්ධයෙන් බලතල බෙදීමේ න්‍යායෙහි ඇති වැදගත්කම විශ්ලේෂණය කරන්න.

3. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය රටෙහි ව්‍යවස්ථාදායක විධායක සහ අධිකරණ යන ආයතනයන් කෙරෙහි ජනාධිපතිවරයා සතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා බලතල දුර්වල කර ඇත.

ඔබ එකඟවන්නෙහිද? මෙම ප්‍රකාශය කොතෙක් දුරට වර්තමාන තත්වය නිර්වචන කරන්නෙහිද? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි අදාල ප්‍රතිපාදනයන් සාකච්ඡා කරමින් ඔබගේ පිළිතුර සනාථ කරන්න.

4. නීති පීය ශිෂ්‍ය සංගමය මගින් විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් අතරෙහි වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලිය පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීම පිණිස දේශන මාලාවක් සංවිධානය කර ඇති බවත් 'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනයෙහි හරය සහ ක්‍රියාවලිය' පිළිබඳ දේශනයක් පැවැත්වීම පිණිස ඔබට ආරාධනා කර ඇති බවත් උපකල්පනය කරන්න. රටෙහි දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලීන් පිළිබඳ අවධාරණය කිරීම ඔබෙන් අපේක්ෂා කරයි.

ශ්‍රී ලංකාව ලිබරල් ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය රාජ්‍යයක් වීමට නම්, යෝජිත නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන්තර්ගත විය යුතු මූලික ලක්ෂණයන් තුනක්, ශ්‍රී ලංකාවේ පළමු සහ දෙවන ජනරජ ආණ්ණ්ඩුක්‍රම ව්‍යවස්ථා වලින් උදාහරණ ගෙනහැර දක්වමින් සාකච්ඡා කරන්න.

5. දිගින් දිගටම සිදුවන වැඩවර්ජනයන්, විරෝධතාවයන් සහ මහජන සාමය කඩ කිරීම් හේතුවෙන් විවිධ බාධාවන්ට ලක්ව ඇති ආණ්ඩුව "අරාජකත්වය වැළැක්වීමේ සහ මහජන සාමය ප්‍රවර්ධනය කිරීමේ" පනත පැනවීම් සඳහා එහි කෙටුම්පතක් ප්‍රකාශයට පත් කරයි. එකී යෝජිත පනත් කෙටුම්පතෙහි පවත්නා මූලික ලක්ෂණයන් සමහරක් පහත පරිදි වේ. **i)** රාජ්‍යය පරිපාලනය, සංචාරක, කැලෑ සහ වනජීවී, අධිකරණ, අධ්‍යාපන, සෞඛ්‍ය, ප්‍රවාහන, ක්‍රීඩා, නිවාස, විදේශ කටයුතු සහ මහජන උපයෝගීතා සේවා අමාත්‍යාංශයන්ට අයත් කිසිදු රජයේ නිලධාරියෙකුට හෝ නිලධාරීන්ගේ වෘත්තීය සමිති වලට කිසිදු වැඩවර්ජන ක්‍රියාවකට සම්බන්ධ විය නොහැකිය. **ii)** වෙනත් කිසිදු රාජ්‍යය නිලධාරියෙකුට හෝ ඔවුන්ගේ වෘත්තීය සමිතියකට වැඩවර්ජනයකට සහභාගිවීමේ චේතනාව දන්වමින් මාස තුනක පූර්ව දැනුම්දීමකින් තොරව වැඩවර්ජනයකට සම්බන්ධ විය නොහැකිය. **iii)** කිසිදු පොදු ස්ථානයක, රජයේ කාර්යාලයක, පොදු මාර්ගයක කිසිදු විරෝධතාවයක් හෝ පෙළපාලියක් නොපැවැත්විය යුතු අතර එලෙස විරෝධතාවයක් හෝ පෙළපාලියක් පවත්වන්නේ නම් එය පැවැත්විය හැකි වන්නේ මාස දෙකක පූර්ව දැනුම් දීමකින් අනතුරුව සහ පොලිසිම මගින් විශේෂයෙන් සඳහන්කරන ස්ථාන වල සහ කාලපරාසයන් තුලදී පමණි. **iv)** රජයේ ප්‍රතිපත්තීන් සම්බන්ධයෙන් කිසිදු රාජ්‍ය නිලධාරියෙකුට තම විවේචනාත්මක දැක්ම හෝ මතය ප්‍රකාශ කළනොහැකිය. ඉහත ප්‍රතිපාදනයන් උල්ලංඝනය කරනු ලබන ක්‍රියා, බරපතළ වැඩ සහිතව බන්ධනාගාර ගතකිරීමකින් සහ අදාළ වැරදිකරුගේ දේපළ රාජසන්තක කිරීම මගින් දඩුවමට ලක්විය හැකි සාපරාධි ක්‍රියාවන් බවට පත්කිරීමට ව්‍යවස්ථා කෙටුම්පත යෝජනා කරයි. එමෙන්ම මෙම පනත්කෙටුම්පත මගින් මෙම ප්‍රතිපාදනයන් උල්ලංඝණය කිරීමක් සිදුවිය හැකි කවර හෝ අවස්ථාවක් මැඩපැවැත්වීම පිණිස පොලිසියට, ඔවුන්ගේ මතය අනුව, අවශ්‍ය ඕනෑම බලයක් භාවිතා කිරීමට සහ එවැනි උල්ලංඝණයන්ට සම්බන්ධ ඕනෑම පුද්ගලයකු, උද්ගතව ඇති තත්වය සාමාන්‍ය තත්වයට පත්ව ඇතැයි පොලිසිය සිතනතාක්කල්, ඕනෑම දින ගණනක් අත්අඩංගුවේ රඳවාතබා ගැනීමට අවසර ලබාදෙයි.

විනිශ්චිත නඩුතීරණ ඇසුරින් පනත්කෙටුම්පතේ ඕනෑම ප්‍රතිපාදනයන් තුනක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳ සාකච්ඡා කරන්න.

6. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ වන පාර්ලිමේන්තුව උත්තරීතර ව්‍යවස්ථාදායක ආයතනයක් නොවන අතර එය බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව විසින් හෝ 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ වූ ජාතික රාජ්‍ය සභාව විසින් හෝ භුක්ති විඳිනු ලැබූ ස්වාධිපත්‍ය සිද්ධාන්තය භුක්ති විඳිනු නොලබයි.

ඔබ එකඟවන්නේහිද? සාකච්ඡා කරන්න.

7. අධිකරණ ස්වාධීනතාවය මගින්, අධිකරණය ආයතනයක් වශයෙන් පමණක් නොව විනිශ්චකාරවරුන් සහ සෙසු අධිකරණ නිලධාරීන් තනි පුද්ගලයන් වශයෙන් ආරක්ෂා කිරීමට සමත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ව්‍යූහයක් සහ ආරක්ෂාවන් අපේක්ෂා කරයි.

ඔබ එකඟවන්නෙහිද? අදාළ මූලික සිද්ධාන්තයන් සහ අධිකාරීන් ඇසුරින් ඔබගේ පිළිතුර සනාථ කරන්න.

******************************